# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

### පෙරදිග සංගීතය

### 6 ශ්‍රේණිය

කාලය - පැය 2 යි

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

නම : .......................................................................... පන්තිය : .........................

I කොටස

1. ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි.
   i. පොත පත කියවා ii. පුංචි තාරකා
   iii. අම්මා මාව දොයි කරන්න iv. මුණි සිරි පාදේ

2. ගාන්ධාරයෙහි පෙරදිග ස්වර සංකේතය වන්නේ,
   i. E ii. Mi iii. ග iv. ධ

3. ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - - | යනුවෙන් ගැයෙන ස්වර ස්ථාපන ගීතය වන්නේ,
   i. පොත පත කියවා ii. මුණි සිරි පාදේ
   iii. බැතිනා සිරිපා iv. කඳු පෙළ අතරේ

4. සප්තකයක ශුද්ධ ස්වර ගණන.
   i. 2කි ii. 4කි iii. 7කි iv. 5කි

5. මධ්‍යමයට වඩා පහල හඬක් ඇති ස්වරයකි.
   i. රිෂභය ii. පංචමය iii. ධෛවතය iv. නිෂාදය

6. ධෛවතයට වඩා ඉහල හඬක් ඇති ස්වරයකි.
   i. පංචමය ii. නිෂාදය iii. ගාන්ධාරය iv. මධ්‍යමය

7. Re ස්වරයෙහි අපරදිග ස්වර සංකේතය වන්නේ,
   i. C ii. D iii. E iv. F

8. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකි.
   i. වයලීනය ii. බටනලාව iii. තබ්ලාව iv. පියානෝව

9. සුෂිර ඝනයට අයත් සංගීත භාණ්ඩයකි
   i. සිතාරය ii. මෙලෝඩිකාව iii. වීණාව iv. එස්රාජය

10. ස්වර සප්තකයෙහි ඇති තීව්‍ර ස්වර ගණන
    i. 1කි ii. 2කි iii. 3කි iv. 4කි

e තක්සලාව

- ගැලපෙන පදය තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| 11. | නරිබෑණා නාට්‍ය යේ නිර්මාතෘ | ආනන්ද සමරකෝන් මහතා |
| 12. | ඉන්දියානු ජාතික ගීයේ නිර්මාතෘ | W. D. අමරදේව මහතා |
| 13. | ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘ | දයානන්ද ගුණවර්ධන මහතා |
| 14. | මාලදිවයිනේ ජාතික ගීයේ නිර්මාණය | ලයනල් අල්ගම මහතා |
| 15. | නරිබෑණා නාට්‍ය යේ සංගීත නිර්මාණය | රබීන්ද්‍රනාත් ටාගෝර් මහතා |

- පහත සඳහන් කියමන් හරි නම්(√) ලකුණද වැරදි නම් (X) ලකුණද යොදන්න.

16. කළ ගෙඩි සෙල්ලම තානම සහිතව ගැයෙන කෙලි ගී විශේෂයකි. ( )
17. ඔලිඳ කෙලිය කාන්තාවන් පමණක් යෙදෙන ජන ක්‍රීඩාවකි. ( )
18. මේවර කෙලිය නැතිවූ දරුවන් පිලිබඳ ගැයෙන ගීත විශේෂයකි. ( )
19. එළුවා හා කොටියා වශයෙන් ප්‍රධාන සත්තව චරිත දෙකක් ඇසුරින් එළුවන් කැම නිර්මාණය වී ඇත. ( )
20. රැන් ඇදිව්වද බලකොයි නැනෝ..... මේවර කෙලියේ එන පදයකි. ( )

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යයි.
- පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. ඔබ ඉගෙනගත් කෝමල ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කර දක්වන්න. (ලකුණු 15)

02.

I. ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ එහි ස්වර සප්තකය ලකුණු කරන්න.

II. දකුණු අතේ රූප සටහනක් ඇඳ අදාළ අංක යොදා ස්වර සප්තකය වාදනය කරන ආකාරය ලියා දක්වන්න.

III. ස්වර පුවරු සංගීත භාණ්ඩ 4ක් නම් කරන්න. (ලකුණු 15)

03.

I. නරිබෑණා නාට්‍යයෙහි "ඇහැල මලින් ගස් පිරිලා" යන ගීතය සම්පූර්ණයෙන් ලියා දක්වන්න.

II. නරිබෑණා නාට්‍යයෙහි ගීත සඳහා පාදක වූ රබන් පදයක් ලියන්න.

III. නරිබෑණා නාට්‍යයෙහි ගීත, සංගීතය පිළිබඳව ඔබ ඉගෙනගත් කරුණු 4ක් ලියා දක්වන්න.

(ලකුණු 15)

04. පහත දැක්වෙන කෙළි ගී සම්පූර්ණ කරන්න.

I. කුරුළු කුඩු කුඩු දූටිම්.

II. සාර සදිසි පෙති පේර නෙලන කල.

III. ඔලිඳ වැපුරුවද බලකොයි නැනෝ.

IV. පේලි සැදී අඟනෝ සැරසීලා.

V. මෙම කෙළි ගී අතුරින් ඔබ කැමති කෙළි ගී වර්ගයක් පිලිබඳ අදහස් ලියා දක්වන්න.

(ලකුණු 15)

05.

I. ශ්‍රී ලංකා ජාතික ගීය සම්පූර්ණයෙන් ලියන්න.

II. ජාතික ගීයේ නිර්මාතෘ වරයා නම් කරන්න. (ලකුණු 15)